

එකෝමත් එක කාලෙක ගහක් සමීපයේ
මුව පැටියෙක් වාසය කළා.

මේ මුව පැටියගෙ යාළුවො දෙන්නත්
මේ ගහ අසබඩම තමයි සිටියෙ.

ඒ තමයි අසල ගසක කූඩුවක් තනා ගෙන
සිටී කොට්ටෝරුව
වගේම, මේ ගහේම සිටි ඉබි රාළ...



එක දවසක්
කැලයේ සැරිසරමින් සිටී දඩයක්කරුවෙක්
දුටුවා මුව පැටියෙකුගෙ පා සලකුණු....

අද හොඳ දවසක්...මේ මුවාට උගුලක්

අටවලා තියා යනවා,හෙට මට රස මුව
මස් කන්න පුළුවනි...
එහෙම සිතූ ඔහු උගුල අටවලා යන්න
ගියා, ඊලඟ දවසෙ එන අදහසින්...



එදා රෑ සුපුරුදු ලෙස වතුර බොන්න ගහ ළඟට ආ මුව පැටියා දඩයක්කරුගේ උගුලට අසු වී බේරෙන්න ක්‍රමයක් නොමැතිව කෑ ගසමින් ඇඬුවා.

ඒ හඬ ඇසුනු කොට්ටෝරුව කල්පනා කළා ඒ හඬ ගැන..කූඩුවෙන් ඉවතට ඇවිත් බැලූ විට දුටුවා යාළුවාට සිදු වී ඇති විපත....

ඉක්මනින් ක්‍රියාත්මක වූ කොට්ටෝරුව ඉබි රාළ සමඟ යාළුවා බේරගන්න ක්‍රමයක් කතා කළා.

"ඔයාගෙ දත් හයිය නිසා මේ දැල ඉරා ගන්න ඔයාට හැකි වේවි.ඔයා ඒ දේ කරන අතරේ මම දඩයක්කරුගෙ ගමන ටික වෙලාවකට පමා කරගන්නම්, ඔයා ඉක්මනින් ඔයාගෙ වැඩේ නිම කරන්න..."එසේ කියූ කොට්ටෝරුව ඉක්මනින් ඉගිළී ගොස් දඩයක්කරුගෙ වත්තේ ගසක වසා බලා සිටියා.



ඒ වෙන කොට ඉබි රාළ  දැල සෑහෙන්න
ඉරා තිබුණා...තව එක කොටසයි ඉතිරිව තිබුණෙ...
ලේ තවරගෙන ඉතා අමාරුවෙන් අවසාන
කොටස නිම කරනවත් එක්කම දුටුවා දඩයක්කරු.
..මුව පැටියයි, කොට්ටෝරුවයි
ඔහුගෙන් බේරුනා ඒත්  දුර්වලව සිටි ඉබි රාළ ට
දුවන්න අමාරුයි...    ඒ නිසා  ඉබි රාළ
දඩයක්කරුට අසු වුණා...

ඉක්මනින් ඉබි රාළ  මල්ලකට දමාගෙන ඔහු වහ වහා පිට වූවා.

සිදු වූ විපත ගැන මුව පැටියාට හරිම දුකයි...කොහොම හරි ඉබි රාළ  බේරගන්නව කියා සිතා දඩයක්කරු ට පේන්න සිටියා.

මුව පැටියා දුටු ඔහු  ඉබිරාළ සහිත මල්ල අසල ගසක එල්ලා  මුව පැටියා ලුහු බැඳ හඹා ගියා.
ඒත් ඔහුගෙන් පලා ගිය මුව පැටියා වෙන පැත්තකින් වනයට ඇතුළු වූවා.



ඉබි රාළ  ඉන්න ඉසව්ව ගැන වැටහීමක්
තිබූ නිසා ඒ කිට්ටුවට  විත් ඉබි රාළ  ට
කථා  කළා, ඉබි රාළ  කීවා
“මම ඉන්නෙ ගහේ අත්තක එල්ලලා.
ඔයා උඩ බලන්නකො එවිට පෙනේවි ”
අවට සිසාරා බැලූ  මුව පැටියා දුටුවා
අත්තක එල්ලෙමින් තියෙන මල්ලක්

ඉක්මනින් ක්‍රියාත්මක වූ මුව පැටියා
එයට උඩ පැනලා ගැහුවා .....

මල්ල බිමට වැටුනා ඉබි රාළත් එක්ක.
ඉබි රාළ  ව මුදවා ගත් මුව පැටියා ඉක්මන් ගමනින් කොට්ටෝරුවා සොයා ගෙන ගියා.



ඔය දෙන්න නිසයි මම බේරුනේ ඔයාලට බොහෝම ස්තුතියි. ඒ වුනාට අපි ඉක්මනින් ම වෙන ප්‍රදේශයකට යමු , එහෙම නොවුනොත් ආයෙම දඩයක්කරු එන්න පුළුවන්....